**යාපනය මහනගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 15 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 24 දින ද සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, යාපනය මහ නගර සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ රු.105,400,677ක ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ වියදම් සිදුකර තිබුණත් මේවා මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙහි ඇතුළත් කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු කිරීමෙන් පසුව 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දේපළ වටිනාකම ඇතුළත් කරනු ලැබේ. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වේ. |
| **(ii)** | පසුගිය වර්ෂ 05කට අධික කාලයක සිට නිරවුල් නොකළ රු.5,358,866ක අත්තිකාරම්වලට අදාල ලේඛන විනාශ වී තිබූ නමුත් මේවා ශේෂපත්‍රයේ වත්කම් ලෙස ඉදිරිපත් කරමින් පැවැති නිසා වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | 1995 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අයත් බැවින් ලේඛන විනාශ වී ඇති නිසා ඒ සඳහා ක්‍රියාමාර්ග ගත නොහැකිව ඇත. | නිරවුල් නොකළ අත්තිකාරම් නිරවුල් කර සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | සභාව විසින් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මෙවැනි දෝෂ අනාගතයේදි සිදුනොවීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | සභාව විසින් වර්ෂ 05 ක් ඉක්ම වූ රු.7,047,866 ක් වූ අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | වර්ෂ 05 ක් ඉක්ම වූ අත්තිකාරම් රු.7,047,866 කින් පාරිතෝෂිකය ලෙස ලබාදුන් මුදල රු.3,148,042.66 ක් වේ. විශ්‍රාම වැටුප් ගෙවීමේදි අඩුකිරීමට කටයුතු කරනු ලැබේ. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්මවූ විවිධ තැන්පතු රු.3,577,446 ක් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කර නොතිබුණි. | අනෙකුත් තැන්පතු සැලැසුම් අංශය විසින් සේවා ගාස්තු ලෙස අයකර තැන්පත් කර ඇත. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | | | |
| | (i) 2018.01.24 දිනැති අංක 05/2018 (1)(අ) චක්‍රලේඛය මගින් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | ප්‍රජාව/ප්‍රතිලාභීන් සඳහා අපේක්ෂිත මහජන සේවාවන් ලැයිස්තුව සකස්කර ප්‍රදර්ශනය කර නොතිබුණි. | සභාව විසින් සිදුකරන සේවාවන් සම්බන්ධයෙන් පොදු සේවාවන් ලැයිස්තුව සකස්කර ප්‍රදර්ශනය කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 2018.01.24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | සේවකයින් සම්බන්ධයෙන් වර්ෂයකට අවම වශයෙන් පැය 12කට අඩුනොවන පුහුණුවක් ලබාදුන් බවට තහවුරු කළ නොහැකිව පැවැතුණි. | පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා පෙර සූදානම් වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 55 ක් සඳහා වර්ෂයකට අධික කාලයක සිට ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදු කිරිමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2002 වර්ෂයේ අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 වැනි වගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශයේ සඳහන් කර ඇති ආකාරයට සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවන්ට රු. 23,656,647 ක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවීම් කර තිබුණත්, එම සැපයුම්කරුවන්ගෙන් “එකතු කළ අගය මත බදු ඉන්වොයිසිය” ලැබී නොතිබුණි. එසේම ගෙවා තිබූ එකතු කළ අගය මත බදු පිළිබඳව, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි. | එකතු කළ අගය මත බදු විස්තර (In,Out) සියල්ල නියමිත කාලපරිච්ඡේදයේදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවනු ලැබේ. | අදාළ පනතට අනුව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 54,859,571ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 158,007,827 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 79,980,704 | 84,852,078 | 95,599,906 | 73,735,000 | 75,047,823 | 84,952,309 |
| කුලී | 217,052,502 | 81,018,183 | 12,969,060 | 222,235,000 | 83,775,696 | - |
| බලපත්‍ර ගාස්තු | 23,732,968 | 25,427,056 | 990,875 | 16,940,000 | 20,320,727 | - |
| වෙනත් ආදායම් | 810,764,099 | 623,575,220 | 21,698,360 | 787,090,000 | 693,738,951 | 247,703,448 |
| | 1,131,530,273 | 814,872,537 | 131,258,202 | 1,100,000,000 | 872,883,197 | 332,655,757 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු. 872,883,197 ක් වුවත්, 2019 වර්ෂයේ රැස්කළ ආදායම රු. 814,872,537 කින් අඩු වී තිබීමෙන් 2018 වර්ෂය සමඟ සැසඳීමේදී 2019 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.58,010,660කින් අඩු වී තිබුණි. | පිළිතුරු ලබාදී නොතිබුණි. | සභාවේ ආදායම් වැඩිකිරීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.91,133,597 ක වරිපනම් හා බදු ලැබිය යුතුව තිබුණි. | වරිපනම් හා බදු ප්‍රතිශතය වැඩිවීම නිසා "K" ආකෘති පත්‍ර යේ ප්‍රතිශත වෙනස්කර නිකුත් කළ යුතු නිසා "K" ආකෘති පත්‍ර බෙදා නොහැර නවතා තිබුණි. | හිඟ හිටි වරිපනම් බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හිඟහිටි ජල ගාස්තු රු. 1,228,063 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ හිටි ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**2.2.4 කඩකුලී**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ කඩ කාමර හිඟ කුලී රු.5,249,390 ක් අයකර ගෙන නොතිබුණි. | 2018, 2019 වර්ෂවල කඩකාමර කිසිවක් කුලියට දී නොතිබුණි. | හිඟ කඩ කුලී අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ බදු කුලී හිඟ රු.7,719,668ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ මස්කඩ 38කින් 19ක් පමණක් බදුදී තිබුණි. | හිඟ කුලී අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**වෘත්තීය බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර අනුමත බලපත්‍ර බදු රු.265,500 ක් හිඟ හිටව පැවතුණද මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | අයකිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | හිඟ මුදල් අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) දුරකථන සන්නිවේදන කුළුණු සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ඒවා ස්ථාපිත කළ කාලයේ සිට අයකර ගෙන නොතිබුණි. | දුරකථන සන්නිවේදන කුළුණු සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | දුරකථන සන්නිවේදන කුළුණු සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

**2.2.6 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු. 15,557,800 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු සිදුකර ඇත. | හිඟ මුදල් නියමිත කාලයේ අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුභසාධනය ආදීය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහනගර සභාවේ අතුරු ව්‍යවස්ථාවේ 272 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් මූලික කාරණා 15ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | මහනගර සභාවේ අතුරු ව්‍යවස්ථාවේ 272 වගන්තිය ප්‍රකාරව සියළුම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කරමින් පවතී. | මහනගර සභාවේ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරකම් 30 වෙනුවෙන්ම කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවතී. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

#### (ඇ) අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනිමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන පවිත්‍රතා මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කාර්යය සඳහා රු. 673,619ක් වැය කර ගොඩනැගිල්ල ඉදිකිරිමේ කාර්යය අවසන් කර තිබුණත් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකරගෙන නොතිබුණි. | අනෙකුත් උපකරණ මිලදී ගැනීමට අදාල අනුමැතින් ස්ථාවර කමිටුව විසින් නියමිත කාලයේදි ලබාදී නොතිබුණි. | නියමිත කාලයේදි අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ඇ) ක්‍රියාකාරකම්වල කාර්යසාධනයේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ක්‍රියාකාරකම් 05 ක කාර්යසාධනයේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර කාලය දීර්ඝ කිරීම් සඳහා හේතු ද පිළිගෙන නොතිබුණි. | නියමිත ආරම්භ දිනයන්හි කාර්යයන් ආරම්භ නොකිරීමේදි කොන්ත්‍රාත් ගිවිසුම් අවලංගු කිරිමට කටයුතු කරනු ලැබේ. | නියමිත කාලයේදි අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | ආවරණය කළ වාහන භාවිතා නොකර විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් ප්‍රවාහනය කිරීමේදි ජනතාවට අපහසුතාවයන්ට මුහුණපෑමට සිදුවි තිබුණි. | අපද්‍රව්‍ය බැහැර කරන වාහන ආවරණය කිරීම සඳහා ලනුවලින් වියන ලද දැල් ලබාදී ඇත. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අනුකූලව ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. |
| (ii) | සෞඛ්‍ය කම්කරුවන් 43දෙනෙකුට වාර්ෂිකව සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණ සිදුකර නොතිබුණි. | අඛණ්ඩව වෛද්‍ය පරීක්ෂණයන් සිදු කර නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වාර්ෂිකව සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. |
| (iii) | සභාව විසින් ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදි වෙන් නොකර එකට එකතු කර රැස්කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය වෙන්කර ලබාදෙන ලෙස උපදෙස් ලබාදී ඇත. | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදි වෙන් කර එකතු කිරීමට කටයුතු කළ යුතුවේ. |

**(ඊ) පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කම්කරුවන්ටත් සියළුම වර්ගයේ ආරක්ෂිත ඇඳුම් ලබාදී ඇත. | පරිසරය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මහනගර සභාවේ භාවිතයේ පවතින අංක WPPB-9029 දරන වාහනය 2014 ජුනි 19 වන දින අනතුරට ලක් වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ XLVIII(I) පරිශිෂ්ඨයේ ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර සභා අරමුදලින් රු. 1,958,200 ක් වැයකර අලුත්වැඩියාවන් සිදුකර තිබුණි. | කොමසාරිස්වරයාගේ ඉල්ලීමට අනුකූලව නැවත විමර්ශනයන් සිදු කෙරෙමින් පවතී. | නියමිත කාලයේදි ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | 2016 වර්ෂය තුලදී සභාවේ කළමනාකරණ සහකරු විසින් රු. 2,934,429 ක්වූ මුදල් වංචනිකව ලබාගෙන තිබුණි. මෙම මුදලින් රු. 2,614,429 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | වංචාවට එරෙහිව අප සභාව විසින් දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පවරා ඇත. එසේම පොලිසිය විසින්ද නඩු පවරා දැනට නඩු දෙකම විභාග වෙමින් පවතී. | කළමනාකරණ සහකරු විසින් සිදුකළ වංචා කළ මුදල අයකර ගැනිමට පියවර ගත යුතුය. |
| (ඇ) | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් නොකිරීමෙන් මහනගර සභාවට අයත් මූලික කාර්යයක් ඉටු නොවී පැවතුණි. | නියමිත කාලය තුළ වාර්තා සකස් කළ යුතු බවට උපදෙස් ලබාදී ඇත. | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | මහජන සේවාවන් ලැයිස්තුගත කර ප්‍රදර්ශනය කර තිබුණද, එහි සඳහන් කරුණුවලට පටහැනිව මහජනතාවට සලසා තිබූ සේවාවන් කාල ප්‍රමාදයකින් පසුව සපයා තිබුණි. | අවශ්‍ය සියළුම ලේඛක ඉදිරිපත් කිරීමේදි ලැයිස්තුවේ සඳහන් කාලය තුළ සේවාවන් සපයනු ලැබේ. | මහනගර සභාව මහජනවට සැලසිය යුතු සේවාවන් ලැයිස්තුවේ ප්‍රදර්ශනය කර ඇති ආකාරයට අනුව සේවාවන් සැලසිය යුතු වේ. |
| (ඉ) | සභාව විසින් වියදම් ණයහිමියන්ට ගෙවිය යුතු වර්ෂ 2 සිට වර්ෂ 5කට අධික කාලයක සිට පවතින රු. 32,656,352 ක ගෙවීම්, ගෙවා නිරවුල් කර නොතිබුණි. | රු. 7,189,626 ක් වූ කාර්යයන් අවසන් වී ඇත. ගෙවීම් සිදුකර නොතිබුණි. රු. 11,214,446ක් වූ මාළු වෙළෙඳ පොල කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවතී. | සභාව විසින් වියදම් ණයහිමියන්ට අදාල මුදල් නිරවුල් කළ යුතුවේ. |
| (ඊ) | සභාව සතු කඩ කාමර 213 ක් පුද්ගලික පාර්ශව සමඟ ගිවිසුම්ගතව බදු දී තිබුණි. බදු ගිවිසුමේ අංක 14, 23 සඳහන් කොන්දේසිවලට පටහැනිව බදු ලබාගත් අය විසින් වෙනත් අයට කඩ කාමර ලබා දී තිබූ අතර බදු කාලය අවසන් වීමෙන් | කොමසාරිස්වරයාගේ ඉල්ලීමට අනුකූලව ක්‍රියාමාර්ග ගෙන ඇත. | සභාව සතු කඩ කාමර 213 ක් නැවතත් ලංසු කැඳවා බදු දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පසුව නැවත ලංසු කැඳවීමෙන් තොරව ගිවිසුම් අලුත් කර තිබුණි. මෙය බදු ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවය නිරූපණය කෙරේ. | | |
| (උ) | මහජන අරමුදල් ප්‍රතිපාදන සහ මහජන පුස්තකාල අරමුදල් ප්‍රතිපාදන පිළිවෙලින් රු. 112,352,309 ක් සහ රු. 135,449,588 ක් කිසිඳු අරමුණක් සඳහා භාවිතා කර නොතිබුණි. | වර්තමාන සභාවේ ආදායම් උපයෝගි කරගනිමින් සංවර්ධන කාර්යයන් ඉදිරියට කරගෙන යනු ලැබේ. | සභාවේ මහජන අරමුදල් ප්‍රතිපාදන සහ මහජන පුස්තකාල අරමුදල් ප්‍රතිපාදන සුදුසු අවශ්‍යතාවන් උපයෝජනය කළ යුතුය. |
| (ඌ) | නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් රු. 18,076,609 ක් මේ දක්වා අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර වෙන්කිරීමක් ලෙසට දක්වා තිබුණි. | මෙම අරමුදල් මහනගර සභාවේ සංවර්ධනය සඳහා අධිකාරියේ අනුමැතිය සමග අනාගතයේදි භාවිතා කෙරේ. | සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රතිපාදන අදාළ අවශ්‍යතා සඳහා භාවිතා කළ යුතුය. |
| (එ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 51ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | වටිනාකම් තක්සේරු කිරීමෙන් පසුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කරනු ලැබේ. | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි 51ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සභාව විසින් විධිමත් අයුරින් මානව සම්පත් ලබාගෙන යෙදවීම සිදුකර නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 248 ක් විසින් නිම කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. | තනතුරු පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ii) | මහනගර සභාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා නොගෙන සෞඛ්‍ය කම්කරුවන් 18 දෙනෙකුට සහ කම්කරුවන්ට පත් වීම් ලබා දී තිබුණි. | ඉල්ලීම් සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අනුමැතිය සඳහා යවා ඇත. | විධිමත් අනුමැතීන් ලබාගෙන පත්වීම් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (iii) | විදුලි කාර්මික පත්වීම් - 2013 සම්බන්ධයෙන් අධ්‍යාපන සුදුසුකම් නොමැති විදුලි කාර්මික තිදෙනෙකුට එරෙහිව කටයුතු කර තිබූ නමුත් වෘත්තීය සුදුසුකම් නොමැති 4 දෙනෙකුට එරෙහිය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රධාන ලේකම් උතුරු පළාත් පාලන කොමසාරිස්ගේ ප්‍රධානත්වයෙන් වු කමිටුවක් ස්ථාපිත කර නියමිත ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | වෘත්තීය සුදුසුකම් නොමැති විදුලි කාර්මිකට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

(ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්‍රාමිකයන් 51දෙනෙකුගෙන් වර්ෂ 05කට අධික කාලයක සිට රු. 372,879ක් වූ හිඟ ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කපා හැරීමට කටයුතු කර ඇත. | සේවක අත්තිකාරම් ණය ශේෂය අයකර ගැනීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 නඩත්තුව හා අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සභාවට අයත් වාහන 10 ක් දිගුකාලයක සිට අලුත්වැඩියා නොකළ තත්ත්වයේ වාහන අංගනයේ පැවතුණි. | වර්තමානයේ මෙම වාහනවලින් ට්‍රැක්ටර් 06ක් ධාවන තත්ත්වයට පත්කර ඇත. | වාහන 10 අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) වාහන 31ක් නිෂ්කාර්යව පසුගිය වර්ෂ 04ක් කාලය පුරා වාහන අංගනයේ තිබුණි. | මහනගර සභාවේ නමට අයිතිය පැවරීමෙන් පසුව පමණක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ හැකිවේ. | වාහන 31ක් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

#### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ භාවිතයේ පවතින සභාවට අයත් නොවූ වාහන 34ක අයිතිය මාරුකිරීම් සිදුකිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයිතිය මාරුකිරීමට කටයුතු කර ඇත. | වාහන 34ක අයිතිය මාරුකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.5 අවිධිමත් ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 02-175/2014 දරන 2014 දෙසැම්බර් 19 දිනැති චක්‍ර ලේඛයට පටහැනිව මහනගර සභාව විසින් රු.36,000 ක් නිල ඇඳුම් දීමනා ලෙස ආයුර්වේද සිද්ද වෛද්‍ය අධිකාරිවරුන්ට ලබාදී තිබුණි. | 2020 වර්ෂයේ දීමනා ලබාදී නොතිබුණු බව සඳහන් කරමි. | මහනගර සභාව විසින් ආයුර්වේද සිද්ද වෛද්‍යවරුනට ලබාදී තිබූ නිලඇඳුම් දීමනාව ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | යාපනය මහනගර සභාව රාජ්‍ය පරිපාලන චක්‍රෙලේඛ අංකය 05/2013 සහ ආයතන සංග්‍රහයේ XXI පරිච්ඡේදය ප්‍රකාරව රු. 1,941,300ක් නිල ඇඳුම් දීමනාව ලෙස සෞඛ්‍ය කම්කරුවන්ට ලබාදී තිබූ නමුත් විසින් රාජකාරි වේලාවේදි නිල ඇඳුමින් සැරසි රාජකාරි ඉටුකර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රෙලේඛ අංක 05/2013 ප්‍රකාරව නිල ඇඳුම් කට්ටල 02ක් වෙනුවෙන් රු. 4,000ක දීමනාවක් ලබාදෙනු ලබේ. | සෞඛ්‍ය කම්කරුවන් විසින් රාජකාරි වේලාවේදි නිල ඇඳුමින් සැරසිම සම්බන්ධයෙන් යාපනය මහනගර සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතුවේ. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ගිවිසුම්ගත කාර්යයන් සහ සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉහත සඳහන් ප්‍රසම්පාදන සැලැස්ම 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ඇත. | නියමිත කාලයේදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.6.2 සැපයුම් හා සේවා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 මාර්ගෝපදේශයේ සඳහන් කරුණට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර සභාව විසින් සමාලෝචිත වර්ෂයේ රු. 4,524,614ක් ගබඩා ද්‍රව්‍ය වෙළෙඳපොල මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කර මිලදී ගැනීම් සිදුකර තිබුණි. | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2හි සඳහන් පරිදි මිලගණන් සඳහා කැඳවීම් සැපයුම් කරුවන්ගේ ලේඛනයේ සඳහන් පුද්ගලික/සමූහයන්ට පමණක් යොමුකර තිබුණි. | මහනගර සභාව විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2හි සඳහන් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහනගර සභාව විසින් වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3හි සඳහන් කරුණු කෙරෙහි සැලකිල්ල යොමුකර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සිදුකර නොතිබුණි. | අනාගතයේදි එලෙස ක්‍රියාත්මක කරනු ලැබේ. | මහනගර සභාව විසින් වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3හි සඳහන් කරුණු අනුගමනය කළ යුතුවේ. |

### 3.6.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහනගර සභාව විසින් මාළු වෙළෙඳපොල ඉදිකිරීම සඳහා 2017 නොවැම්බර් 13 දින රු. 19,352,640කට ගිවිසුම් සඳහා එළැඹ තිබූ අතර එම කාර්යය අවසන් නොකිරීම හේතුවෙන් අදාල කොන්ත්‍රාත්කරු සමග එළැඹ තිබූ ගිවිසුම 2019 පෙබරවාරි 02 දින අවසානයට පත්කර තිබුණි. | අවසාන දැනුම්දීම ඔහුට ඉදිරිපත් කර නියමිත මුදල ආපසු ලබාගැනීමට කටයුතු කරමින් පවති. | මාළු වෙළෙඳපොල ඉදිකිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් හා තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය විම හේතුවෙන් මෙම අයවැය අකාර්යක්ෂම අයවැයක් ලෙස දක්නට ලැබුණි. | විචලනයන් සැලකිල්ලට ගෙන අයවැය සකස් කිරීමට කටයුතු සිදුකරනු ලැබේ. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 4.2 නිරවුල් නොකළ විගණන නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදි කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබූ පශු ශල්‍ය වෛද්‍ය විශේෂඥවරයා සම්බන්ධයෙන් ලබාදුන් වැටුප නිතියට පටහැනි ගෙවිමක් වන අතර විගණනයේදි අනුමත කළ නොහැකි විය. | පළාත් පොදු ගිණුම් කාරක සභාවේ (COPA) උපදෙස් ප්‍රකාරව විමර්ශන කමිටුව පත්කර මෙම කමිටුව විසින් විමර්ශනය සිදුකරන ලදි.<br>වාර්තාව ලැබූ විගස සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නිරවුල් නොකළ විගණන විමසුම් නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් ඉංජිනේරු පත්වීම සඳහා අනුමත නොවූ වැටුප් සහ ප්‍රවාහන වියදම් රු.750,791 ක් සම්බන්ධයෙන් විගණන වාර්තාවලින් ද සඳහන් කර තිබුණි. මෙම ගෙවීම නිතියට පටහැනි ගෙවීමක් වන අතර විගණනයේදී අනුමත කළ නොහැකි විය. | පළාත් පොදු ගිණුම් කාරක සභාවේ (COPA) උපදෙස් ප්‍රකාරව විමර්ශන කමිටුව පත්කර මෙම කමිටුව විසින් විමර්ශනය සිදුකරන ලදි. විමර්ශන වාර්තාව ලැබූ විගස එයට අනුකූලව ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නිරවුල් නොකළ විගණන විමසුම් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | අනුමැතියකින් තොරව නිවාඩු ගොස් සිටි නිලධාරියාගෙන් රු. 202,792ක් වටිනා වැටුප් ආපසු අයකර ගැනීමට කටයුතු කර තිබූ නමුත්, මේ දක්වා අදාල ගෙවීම අයකර ගෙන නොතිබුණි. | මහනගර සභා කොමසාරිස්වරයා විසින් 2019.10.15 දිනැති අංක E/PF/CE/1482 දරන ලිපිය මගින් අදාල මුදල අයකිරිම සඳහා 2වැනි සිහිකැඳවීම් යවා ඇත. | නිරවුල් නොකළ විගණන විමසුම් නිරවුල් කළ යුතුය. |